හැදින්වීම

වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයට අයත් වන අතර වර්ග කි.මී 210.06 විශාලත්වයකින් යුක්තවේ.මෙම කොට්ඨාශය තෙත් කලාපීය වනාන්තර අතර සිංහරාජ උද්‍යානයේ උප නිර්මිතයක් වශයෙන් වැදගත්කමක් උසුලයි.

කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඌන ග්‍රාම නිලධාරී වසම් 60 ක් අතරින් පොදු පහසුකම් වලින් හා ස්වභාවික සම්පත් හා ශ්‍රම බලකයකින් සමන්විත යහපත් දේශගුණික තත්වයන්ගෙන් යුක්ත වන අතර සමස්ත වශයෙන් කඳුහෙල් හා තැනිතලාවන්ගෙන් හා මැටි පස්වලින් සමන්විත වසමක් ලෙස 849 මීගහතැන්න වසම හැදින්විය හැකිය.

එමෙන්ම උතුරින් මොරගල වසමින්ද දකුණින් මද්දෙගම ඒ වසමින්ද නැගෙනහිරින් 849 සී මල්ලව්විගොඩ වසමින්ද බටහිරින් ලිහිණියාව උතුර යන වසම් වලින් මායිම් වෙයි.මෙහි හෙක්. 376.3 කින් යුක්ත වන අතර අයත් ගම්මාන ලෙස කොක්කුඹුර,ගල්මුල්ල,ඉදිගස්ගොඩැල්ල,අක්කර10,බරෝඩෙල්වත්ත,ජනඋදානගම,මී ගහතැන්න නගරය,බෝගොඩ කන්ද,පාළුපුස්සගොඩ,ඉහලෝකන්ද ලෙස ගම්මාන වලට බෙදී ඇත.

දේශගුණික සාධක ලෙස සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 85°ෆැරන්හයිට් වන අතර වර්ෂාපතනය 200-300 ත් ලෙසත් දේශගුණික කලාපය පහතරට තෙත් ලෙසත් වර්ෂාපතනය ලැබෙන කාලය පහතරට තෙත් ලෙසත් සඳහන් කල හැකිය.

මේ අනුව මෙහි ජනතාව තේ,රබර්,කුරුඳු,ගොවිතැන් වන කෘෂිකාර්මික කටයුතු වල නිරත වෙමින් කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගත කරයි.

වසමට යන ගමන් මාර්ග

මතුගමින් ගමන් ආරම්භය සිදු කලහොත් ගමන් මාර්ග දෙකකින් වසමට පැමිණිය හැකිය.ඉන් එක් මාර්ගයක් පැලවත්තට අගලවත්ත මාර්ගය හරහා පැමිණෙන බස් රථයෙන් සහ පැලවත්තට හොරවල හරහා පැමිණෙන බස් රථයෙනි.පසුව මෙම බස් රථවලින් නැග මීගහතැන්න නගරයෙන් බැස වසම තුලට ගමන් කල හැකිය.වසම ආරම්භය කොක්කුඹුර පන්සල සහ මීගහතැන්න ප්‍රාථමික විද්‍යාලය වසම අවසාන මායිම් වෙයි.මෙම මාර්ගය අතර අතුරු මාර්ග පවතී .ගල්මුල්ල මාර්ගයෙන් ඇතුලු වූවිට ඉදිගස්ගොඩැල්ල/අක්කර 10/බරොඩෙල් වත්ත /ඡනඋදානගම මාර්ග වෙතද ලගාවිය හැකිය.ඒ අනුව වලල්ලාවිට මාර්ගයේ 500 මීටර් ගමන් කල විට ඉහලෝකන්ද යන මාර්ගද ගමන් කල හැකිය.මේ අතර තුර පාළුපුස්ස ගොඩ,මහ වත්ත යන අතුරු මාර්ගද වසම තුල පවතී.

වසමේ නම හැදුන ආකාරය

849 මීගහතැන්න වසමට මීගහතැන්න යන නම පටබැදුන ආකාර දෙකක් ඇති බව පැරන්නන්ගේ මතය වී ඇත.ඉන් පලමු වැනන් ලෙස අතීතයේ මීගහතැන්න ප්‍රාථමික විද්‍යාලයේ විශාල මී ගසක් තිබූ තැන්නක් නිසා මීහගතැන්න ලෙසත් දෙවන මතය ලෙස මෙහි මිනිරන් පතල්වලට ප්‍රසිද්ධ වූ නිසා මීගහතැන්න ලෙස නම් කල බව සඳහන් කල හැකිය.